
# ටොමීගේ යාලුවෝ



රනුල්යා අර්සකුලසූරිය

# ටොමීගේ යාළුවෝ

කතෘ : රනුල්යා අර්සකුලසූරිය

සියලුම හිමිකම් ඇවිරිණි

කතෘගේ වෙනත් කෘති : අඹ බබා

මහාමායා බාලිකා විදුහල, මහනුවර
2 ශ්‍රේණිය C

කෘතිය පළ කරන දින : 2025.02.08

ISBN: 9786242085142

# පිදුම

දයාබර මහාමායාවට සහ මට

උපකාර කළ සැමට.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය.

ශශිකලා සේනාධීර.

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

අපේ ගෙදර ඉන්නවා ටොමී කියලා පුංචි ලස්සන බලු පැටියෙක්. ටොමීට අපි හැමෝම ආදරෙයි.



ඔන්න එක දවසක්, අපේ පවුලේ හැමෝම එක්ක විනෝද චාරිකාවක් යන්න පිටත් වුණා. ඒත් ඒ ගමනට ටොමීව එක්කන් යන්න අපිට පුළුවන් කමක් තිබුණේ නෑ.



ඉතින් ඔන්න අපි පිටත් වෙනකොට අපේ පුංචි ටොමීට තනිකමක් දැනුණා. වාහනය නොපෙනී යන තුරුම ගේට්ටුව අසලට වී බලාගෙන සිටියා.



ඉතින් අපි යනකොට ගොඩක් රෑ වුණා. හෙමිහිට හෙමිහිට උදේ වුණා. ටොමීට ගොඩක් පාළුයි. එයා පාරේ ඇවිදගෙන ඇවිදගෙන උඩට ම ගියා.




පුංචි ටොමී දැක්කා තවත් ලස්සන බලු පැටවුන් තුන් දෙනෙක් සෙල්ලම් කරමින් ඉන්නවා. ඒත් පුංචි ටොමීට සෙල්ලම් කරන්න කවුරුත් නැහැ.



වෙන දවස්වල නම් අපේ පවුලේ කවුරු ම හරි පුංචි ටොමීත් එක්ක සෙල්ලම් කරනවා. ඉතින් ඔන්න එතන හිටපු එයාගේ එක බලු පැටියෙක් එයාගෙන් ඇහුවා “ඇයි ඔයා දුකින් ඉන්නේ?” කියලා.




ඉතින් පුංචි ටොමී මේ බලු පැටියට මුළු විස්තරේම කිව්වා. ඉතින් ඔන්න මේ පුංචි බලු පැටියට ටොමී ගැන දුක හිතිලා එයාවත් සෙල්ලම් කරන්න ගත්තා.



ඔන්න ඉතින් පුංචි ටොමීවත් සෙල්ලම් කරන්න ගත්ත නිසා එයාට ගොඩක් සතුටුයි. දැන් එයාට පාළුත් නෑ. ඉතින් මෙයා හැමදාම උදේට මේ පුංචි බලු පැටව් ටිකත් එක්ක සෙල්ලම් කරන්න යනවා . ඔන්න ඉතින් දවස් පහක ට විතර පස්සේ අපි ආයිත් ගෙදර ආවා. ඒත් වෙනදට නම් ටොමී අපි එනකොට නැට්ට වන වන ඉන්නවා ඒත් අද ටොමී එතන හිටියේ නෑ. ටොමී ඉඳලා තියෙන්නේ එයාගේ යාළුවොත් එක්ක සෙල්ලම් කරමින් එනිසා අපි එන සද්දේ එයාට ඇහිලා නෑ.



ටොමී එයාගේ යාළුවන්ට අපි ආයෙත් ගෙදර ආව බව කිව්වා. ඉතින් එයාගේ යාළුවෝ කිව්වා, “එහෙනම් ඔයා යන්න කියලා”. ඉතින් ඊට පස්සේ ටොමී කිව්වා, “අපි ආයෙමත් දවසක හම්බ වෙලා හොඳට සෙල්ලම් කරමු මම ගිහින් එන්නම්”.කියලා.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN: 9786242085142